රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 30/2014

මගේ අංකය :EST/08/COMPT/02/3000/11

රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.
2014.12.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්.

## මැතිවරණ රාජකාරියේ යෙදී සිටිය දී මරණයට හෝ තුවාල පීඩාදියට හෝ ගොදුරු වන මැතිවරණ කාර්ය මණ්ඩලයට වන්දි ගෙවීම

මැතිවරණ කොමසාරිස්වරයා විසින් පවත්වනු ලබන ඡන්ද විමසීම්වල නිරත වන යම් රජයේ/පළාත් සභා/ සංස්ථා නිලධරයෙක් හෝ වෙනත් අයෙක්, ඔහු/ ඇය විසින් -

I. සිය මැතිවරණ රාජකාරි ඉටු කිරීමේ දී හෝ,

II. මැතිවරණ රාජකාරි ඉටු නොකරන අවස්ථාවක දී වුව ද, තමා ගේ සාමාන්‍ය මැතිවරණ රාජකාරිවල විෂයය සීමාව ඇතුළත වූ යම් ක්‍රියාවක් කිරීමේ දී හෝ,

III. මැතිවරණ රාජකාරි කටයුතු ඉටු කිරීමෙහි ලා යම් ක්‍රියාවක් කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ,

IV. මැතිවරණ සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරි කටයුතුවල නිරත වීම සඳහා යන ගමනක දී හෝ එම සේවා ස්ථානයට ආපසු එන ගමනක දී හෝ

V.

(අ) සිය වාසස්ථානයේ හෝ නිත්‍ය සේවා ස්ථානයේ සිට මැතිවරණ රාජකාරි සඳහා වාර්තා කිරීම පිණිස එම සේවා ස්ථානය දක්වා හෝ

(ආ) මැතිවරණ රාජකාරියෙන් පසු එම සේවා ස්ථානයේ සිට වාසස්ථානය දක්වා හෝ තම නිත්‍ය සේවා ස්ථානය දක්වා හෝ යන ගමනක දී හෝ,

තුවාල සිදුවීමකට භාජනය වූයේ නම් හෝ නිත්‍ය වශයෙන් ආබාධිත තත්ත්වයට පත්වූයේ නම් හෝ මරණයට පත් වූයේ නම් හෝ ඔහුට/ ඇයට හෝ ඔහු/ ඇය මිය ගියේ නම් ඔහුගේ/ ඇයගේ යැපෙන්නන්ට මෙම චක්‍රලේඛයේ මතු දැක්වෙන අයුරින් වන්දි මුදල් ගෙවිය යුතුය.
එසේ වුවත් එම නිලධරයා අනතුරට පත්වන අවස්ථාවේ දී,

I. යම් නීතියක් හෝ දෙපාර්තමේන්තු නියමයක් හෝ රෙගුලාසියක් හෝ උල්ලංඝනය වන අයුරින් ක්‍රියා කර ඇත්නම්,
   හෝ/ හා
II. අනතුර සිදුව ඇත්තේ නිලධරයා ද වගකිවයුතු නොසැලකිලිමත් භාවයක් නිසා නම්, ඔහුට ලැබිය හැකි වන්දි මුදලෙහි යම් අඩු කිරීමක් කළ යුතුය.
III. නිලධරයා බීමත්ව සිටියේ නම්, ඔහුට වන්දි ගෙවීමක් නොකළ යුතුය.

02. තුවාල සිදුවීමක දී ගෙවන වන්දි ප්‍රමාණය ගණනය කිරීමේ පදනම වන්නේ එසේ තුවාල වීමෙන් (නිලධරයාගේ රැකියාව අනුව) ඔහුගේ ඉපයීමේ ශක්තිය හීනවීම හෝ සදා සිරුරේ විරූප වීම ආදියෙහි ප්‍රමාණයයි.

03. මූල්‍යමය වන්දිය :-

| | |
|---|---|
| I. තුවාලයෙන් මරණය සිදුවුණි නම් - | මෙම චක්‍රලේඛයේ 8 වගන්තියේ සඳහන් වන්දි මණ්ඩලයේ නිර්දේශ මත මැතිවරණ කොමසාරිස් විසින් නිලධරයාගේ යැපෙන්නන්ට වන්දි ගෙවනු ලැබේ. නිලධරයා මෙම චක්‍රලේඛයේ 01 ඡේදයේ V වන අවස්ථාව යටතේ අනතුරට පත් වී නම් ඔහු අවසන් වරට ලබමින් සිටි වැටුප මෙන් මාස 150 ක වැටුප ද I, II, III, IV යන අවස්ථාවන් යටතේ අනතුරට පත්වී නම් එමෙන් දෙගුණයකට සමාන මුදලක් එනම් මාස 300ක වැටුප ද වන්දි වශයෙන් ගෙවනු ලැබේ. |
| II. එම තුවාලයෙන් සදා සම්පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වූයේ නම් - | මෙම චක්‍රලේඛයේ 8 ඡේදයේ සඳහන් වන්දි මණ්ඩලය විසින් අදාල අනතුර සම්බන්ධයෙන් වන වෛද්‍ය මණ්ඩල වාර්තාව ද දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද පදනම් කරගෙන නිලධරයා " සදා සම්පූර්ණ ආබාධිත තත්ත්වයට පත්ව ඇති බව" හා වර්තමාන රැකියාව කිරීමට යෝග්‍ය නොවන බව තීරණය කළහොත් නිලධරයාට ඉහත I හි පරිදි වන්දි ගෙවනු ලැබේ. |

III. එම තුවාලයෙන් සදා අර්ධ ආබාධිත තත්ත්වයට පත්වූයේ නම් - මෙම චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දක්වා ඇති උපලේඛනය ප්‍රකාරව වෛද්‍ය මණ්ඩලය විසින් නිගමනය කරනු ලැබූ ඉපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය පදනම් කරගෙන මාස 60 ක වැටුපේ ප්‍රතිශත ප්‍රමාණයන් ලෙස මෙම චක්‍රලේඛයේ 8 ඡේදයේ සඳහන් වන්දි මණ්ඩලය විසින් ගෙවිය යුතු වන්දිය තීරණය කරනු ලබනු ඇත. නිලධරයා මෙම චක්‍රලේඛයේ 01 ඡේදයේ I, II, III හෝ IV යන අවස්ථාවන් අතරින් එකක් යටතේ අනතුරට පත්ව ඇත්නම් එම වන්දි මුදල දෙගුණ වේ. කෙසේ වෙතත් රෝගියා ඔහුගේ වර්තමාන රැකියාව සඳහා නුසුදුසු වන විට එවැනි රෝගියෙකු මේ වර්ගය යටතේ වෛද්‍ය මණ්ඩලය වර්ගීකරණය නොකරනු ඇත. රෝගියා ඔහුගේ වර්තමාන රැකියාව කිරීම සඳහා සුදුසු නොවන බවත් ඔහු "සදා සම්පූර්ණ ආබාධිත තත්ත්වයට" පත්ව ඇති බවත් ඒ වෙනුවට වාර්තා කරනු ඇත.

IV. එම තුවාලයෙන් තාවකාලික අර්ධ ආබාධිත තත්ත්වයට පත් විණි නම් - වෛද්‍ය මණ්ඩලය විසින් නිගමනය කරනු ලැබ ඇති (තාවකාලික) ඉපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය පදනම් කර ගෙන මාස 15 ක වැටුපේ ප්‍රතිශත ප්‍රමාණයන් ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගෙවිය යුතු වන්දිය තීරණය කරනු ඇත. එමෙන්ම නිලධරයා අනතුරට පත්ව ඇත්තේ මෙම චක්‍රලේඛයේ 01ඡේදයේ I, II, III හෝ IV යන අවස්ථාවන් අතරින් එකකදී නම් එම වන්දි මුදල දෙගුණ වේ. තව ද වෛද්‍ය මණ්ඩලයේ පරීක්ෂාවට භාජනය කරනු ලබන අවස්ථාවේ දී ලබා ගත හැකි වාර්තා පදනම් කරගෙන රෝගියා තුවාලය ලැබූ අවස්ථාවේ දී පත් ව සිටි තාවකාලික ආබාධිත තත්ත්වය වෛද්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගනු ලබනු ඇත.

රෝගියාගේ ඉපයීමේ ශක්තිය හීනවීම සහ/ හෝ සදා විරූපවීම පිළිබඳව නිගමනය කිරීම සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෛද්‍ය මණ්ඩලයක් පත් කරනු ඇත.

04. නිලධරයකු මරණයට පත් වූ විට කළ යුතු ගෙවීම්

I. හදිසි අවශ්‍යතාවක් වශයෙන් දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී විසින් අවශ්‍ය වෙතොත් නිලධරයාගේ නිවසට මෘතදේහය ප්‍රවාහනය කර දීම සඳහාත් අවමංගල්‍යකරුවන්ගේ වියදම් දැරීම සඳහාත් මැතිවරණ දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයට හර කිරීම පිණිස රු.40,000ක මුදලක් අවසන් කටයුතු ඉටු කරනු ලබන වැන්දඹු ස්වාමි පුරුෂයාට/ බිරිඳට හෝ දූ දරුවන්ට/ දෙමව්පියන්ට හෝ සහෝදරාදීන්ට හෝ මුදා හැරිය යුතුය.මෙම මුදල ආපසු අය කර ගනු නොලබන ගෙවීම් වේ.

II. නිලධරයා මිය යන අවස්ථාවේ දී ඔහු/ ඇය දැරූ ශ්‍රේණියට ඉහළින් ශ්‍රේණියක් වෙතොත් එම ශ්‍රේණියට උසස් කරනු ලැබිය යුතු ය.

III. අනතුර සිදු වූ තැනැත්තා රාජ්‍ය අංශයේ නිලධරයෙක් නම් ඔහුගේ වයස අවුරුදු 55 ට එළඹෙන දිනය දක්වා ඔහුට හිමි වැටුප, වැටුප් වර්ධක හා දීමනාවන් සහිතව යැපෙන්නන් වෙත ගෙවීම සහ ඉහත II ට අනුව ලද උසස්වීමට පසුවත් ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීම් සහිත තනතුරක් නම් එම උසස්වීම් ලබා ගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතාවන්ගෙන් කාලය පිළිබඳව අවශ්‍යතාව පමණක් සලකා එම උසස්වීම ලබා දී වැටුප් සංශෝධනය කිරීම නිලධරයා සේවය කළ දෙපාර්තමේන්තුව/ ආයතනය මඟින් කරනු ලැබිය යුතු ය.

IV. යැපෙන්නන් අතර වන්දි මුදල් බෙදී යන ආකාරය.

(අ) කලත්‍රයාට - අදාල වන්දි මුදලින් අඩක්.

(ආ) දරුවන්ට - ඉතිරි මුදල නිලධරයාගේ යැපෙන්නන් ලෙස සැලකෙන දරුවන් අතර සම සේ බෙදිය යුතුය. එනම්,

1. වයස අවුරුදු 26ට අඩු අවිවාහක රැකියා විරහිත දරුවන්
2. වයස අවුරුදු 26ට වැඩි අවිවාහක රැකියා විරහිත දියණියන්
3. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමි වන වර්ගයේ අංගවිකල දරුවන්

(ඇ) කලත්‍රයා නිලධරයාට පළමුව මිය ගොස් ඇත්නම් - සම්පූර්ණ වන්දි මුදල දරුවන් අතර සම සේ බෙදිය යුතුය.

(ඉ) එකම යැපෙන්නා කලත්‍රයා පමණක් නම් මුළු මුදලම කලත්‍රයාට ගෙවිය යුතුය.

(ඊ) මිය ගිය නිලධරයා අවිවාහකව සිටියේ නම් ජීවත් වන ඔහු ගේ/ ඇයගේ දෙමව්පියන් අතර වන්දි මුදල සම සේ බෙදිය යුතු අතර දෙමව්පියන් අතරින් එක් අයෙකු මියගොස් ඇත්නම් මුළු මුදල ජීවත්ව සිටින මවට හෝ පියාට ද,දෙදෙනාම මිය ගොස් ඇත්නම් නිලධරයාගේ යැපෙන්නන් ලෙස සැලකිය හැකි සහෝදර සහෝදරියන් අතර ද මුළු මුදල සම සේ බෙදිය යුතුය.එනම්,

1. වයස අවුරුදු 26 ට අඩු අවිවාහක රැකියා විරහිත සහෝදර සහෝදරියන්
2. වයස අවුරුදු 26 ට වැඩි අවිවාහක රැකියා විරහිත සහෝදරියන්
3. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමි වන වර්ගයේ අංගවිකල සහෝදර සහෝදරියන්

සටහන -

I. මරණයක් සිදු වූ විගස අදාළ දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී විසින් ඒ පිළිබඳව මැතිවරණ කොමසාරිස් සහ මිය ගිය නිලධරයා ගේ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා වෙත නොපමාව වාර්තා කළ යුතු ය.

II. තේරීම් භාර නිලධාරී විසින් මිය ගිය නිලධරයා ගේ මරණ සහතිකය ඉක්මණින් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු අතර එම සහතිකය දෙසතියක් ඇතුළත දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

III. තේරීම් භාර නිලධාරීයාගේ දැනුම් දීම හා මියගිය නිලධරයාගේ මරණ සහතිකය දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා වෙත ලැබුණු වහාම මැතිවරණ කොමසාරිස්ගෙන් ප්‍රතිපාදන ලබා ගෙන හෝ ප්‍රතිපාදන ප්‍රතිපූරණය කර ගැනීමේ වැඩපිළිවෙළක් ඔහු සමග යොදා ගෙන දෙපාර්තමේන්තු/ආයතන වැය ශීර්ෂ වලින් හෝ ගෙවීම් කළ යුතු ය.

05. වන්දි විශ්‍රාම වැටුප්

ලත් තුවාල නිසා මිය යන හෝ සදා සම්පූර්ණ බෙලහීනතාවයට පත්වන නිලධරයකුගේ වයස අවුරුදු 55 ට අඩු නම් ඔහු කල්පිතව අවුරුදු 55 න් විශ්‍රාම ගියා සේ සලකා විශ්‍රාම වැටුප ගණනය කරනු ලැබේ.එසේ මිය ගිය හෝ සදා සම්පූර්ණ දුබලතාවයට පත් වන නිලධරයෙකුගේ වයස අවුරුදු 55 ට වැඩි නම් ඔහු කල්පිතව වයස 60 දී විශ්‍රාම ගියා සේ සලකා විශ්‍රාම වැටුප ගණනය කරනු ලැබේ. මේ අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කරනු ලැබේ.

06. නිවාඩු

තුවාලයේ ස්වභාවය අනුව හා වෛද්‍ය මණ්ඩලයේ නිර්දේශය අනුව ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 9:1 වගන්තියෙහි විධිවිධාන පරිදි නිවාඩු ලබා ගැනීමට නිලධරයාට අවසර ඇත.

07. වන්දි ගෙවීම සඳහා සාධක වන සාක්ෂි:

(අ) I. තුවාල ලත් නිලධරයා වහාම වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කළ / යොමු විය යුතු අතර ඒ බව නොපමාව තේරීම් භාර නිලධාරීට දැන්විය යුතු ය.

II. ඔහු වෛද්‍ය මණ්ඩලයක් හමුවට පමුණුවන ලෙස තේරීම් භාර නිලධාරී විසින් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් වහාම ඉල්ලීමක් කළ යුතු ය.

III. වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලය,
මෙම චක්‍රලේඛයේ 2 වැනි වගන්තියේ කුමන වර්ගයට රෝගියා අයත් වන්නේ ද යන්න සහ/හෝ ඉපයීමේ ශක්තිය හීන වීමේ ප්‍රතිශතය සහ/ හෝ ශරීරයේ සදා විරූපවීමක් ඇත්නම් එය, රෝගියාගේ සාමාන්‍ය රාජකාරි ඉටු කිරීමේ හැකියාව, නිලධරයාට දිය යුතු නිවාඩු දැක්වෙන සිය වාර්තාව දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යැවිය යුතු ය.

(ආ) සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් මෙම විධිවිධාන පිළිපැදීම සඳහා අවශ්‍ය උපදෙස් අදාළ සියළු නිලධරයන්ට දැන්විය යුතු ය. තව ද රෝගීන්ගේ ඇඳ ඉහපත ඇතුළු සියළුම වාර්තා වෙනම ලේඛනාගාරයක හෝ කැබිනෙට්ටුවක වෛද්‍ය මණ්ඩලවල ප්‍රයෝජනය සඳහා පහසුවෙන් සොයා ගැනීම පිණිස ගබඩා කර තබන ලෙස සියළුම වෛද්‍ය නිලධාරින්ගෙන් ඔහු විසින් ඉල්ලා සිටිනු ඇත.

(ඇ) පරීක්ෂණ කමිටු වාර්තාව

දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී විසින් අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට මාණ්ඩලික නිලධරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුතු ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරනු ලැබිය යුතුය. එම කමිටුව විසින් පහත තොරතුරු ද ඇතුළත් සවිස්තර පරීක්ෂණ කමිටු වාර්තාවක් ( කමිටු නිර්දේශය ද ඇතුළත්ව) සකස් කර දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී වෙත ලබා දිය යුතුය.

I. නිලධරයා රාජකාරියට පැමිණෙමින් සිටිය දී හෝ මැතිවරණ රාජකාරි නිමකර ආපසු යාමේ දී සිදු වූ අනතුරක් නම්

(අ) නිලධරයා සේවා ස්ථානයට සාමාන්‍යයෙන් පැමිණිය යුතු වේලාව/පිට විය යුතු වේලාව සහ පැමිණි/ පිට වූ වේලාව

(ආ) නිලධරයා සාමාන්‍යයෙන් සේවා ස්ථානයට පැමිණෙන ලිපිනය, අනතුර සිදු වී ඇති ස්ථානයට ඇති දුර, පැමිණි ආකාරය, ගමන් කළ දුර හා ගත වී ඇති වේලාව (සාමාන්‍ය ගමන් මාර්ගයෙන් බැහැර තැනක දී අනතුර සිදු වී ඇත්නම් ඒ පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍යය)

(ඇ) හැකි අවස්ථාවල දී නිලධරයාගේ ප්‍රකාශයේ සහ අනතුර දුටු අයගේ ප්‍රකාශයන්හි අන්තර්ගත කරුණු පිළිබඳ නිරීක්ෂණ

(ඈ) මැතිවරණය පැවැත්වෙන දිනට පෙර හෝ පසු දිනක අනතුර සිදු වී ඇත්නම් නිලධරයා එම දිනයන්හි සේවය කිරීමට පූර්ව අනුමතිය ලබා ගෙන ඇත්ද යන වග

(ඉ) මෝටර් රථයක්/ යතුරු පැදියක්/ වෙනත් වාහනයක් ධාවනය කරමින් සිටිය දී අනතුර සිදු වී ඇත්නම් රියැදුරු බලපත්‍රය, ආදායම් බලපත්‍රය සහ රක්ෂණාවරණය තිබේ ද යන වග

II. නිලධරයා මැතිවරණ රාජකාරියේ නිරතව සිටිය දී සිදු වූ අනතුරක් නම් එම වාර්තාවට පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

(අ) නිලධරයා මැතිවරණ රාජකාරි සඳහා වාර්තා කළ යුතුව තිබූ වේලාව සහ රාජකාරියට වාර්තා කළ වේලාව

(ආ) අනතුර සිදු වී ඇත්තේ නිලධරයා සාමාන්‍ය මැතිවරණ රාජකාරි ඉටු කිරීමේදී ද නැතහොත් පවරන ලද විශේෂ රාජකාරියක් ඉටු කිරීමේදී ද යන වග

(ඇ) හැකි අවස්ථාවල දී නිලධරයාගේ ප්‍රකාශයේ සහ අනතුර දුටු අයගේ ප්‍රකාශයන්හි අන්තර්ගත කරුණු පිළිබඳ නිරීක්ෂණ

(ඈ) මැතිවරණය පැවැත්වෙන දිනට පෙර හෝ පසු දිනෙක අනතුර සිදු වී ඇත්නම් නිලධරයා එම දිනයන්හි සේවය කිරීමට පූර්ව අනුමතිය ලබා ගෙන ඇත්ද යන වග

(ඉ) මෝටර් රථයක්/යතුරු පැදියක්/වෙනත් වාහනයක් ධාවනය කරමින් සිටිය දී අනතුර සිදු වී ඇත්නම් රියැදුරු බලපත්‍රය, වාහන ආදායම් බලපත්‍රය සහ රක්ෂණාවරණය තිබේද යන වග

08. තීරණ බලධාරියා

දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී විසින් වෛද්‍ය මණ්ඩලයේ වාර්තාව ද, පොලිස් වාර්තාව ද, පරීක්ෂණ කමිටු වාර්තාව ද, අනතුර පිළිබඳව ඇති නඩු හා අනෙකුත් නෛතික කටයුතු පිළිබඳ තොරතුරු ද, ඔහුගේ නිර්දේශයන් ද, නීති කඩ කිරීම්, දෙපාර්තමේන්තු රෙගුලාසි කඩ කිරීම් හා නිලධාරියාගේ නොසැලකිලිමත්කම පිළිබඳ නිරීක්ෂණ ද අදාල වන අනෙකුත් ලේඛන සමඟ අනතුරට පත් නිලධාරියා හෝ ඔහු වෙනුවෙන් යැපෙන්නන් විසින් ඉදිරිපත් කරනු ලබන වන්දි ඉල්ලීම මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. ඉහත 03 වන ඡේදයේ IV යටතේ සඳහන් වන්දි ගෙවීම සම්බන්ධයෙන් වන තීරණ මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගනු ලබන අතර අනෙකුත් සියළුම වන්දි ගෙවීම සම්බන්ධයෙන් වන තීරණය ගනු ලබන්නේ මැතිවරණ කොමසාරිස්, ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන නියෝජිතයෙක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන නියෝජිතයෙක් යන අයගෙන් සමන්විත වන්දි මණ්ඩලයක් විසිනි.

09. හදිසි අනතුර සිදු වී වසරක් ඇතුළත වන්දි අයදුම්පත මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. එම කාල සීමාවට වඩා ප්‍රමාද වී වන්දි අයදුම්පතක් ඉදිරිපත් කරන්නේ නම් එම ප්‍රමාදයට හේතු වූ කරුණු හා එය සාධාරණීකරණය කළ හැකි බවට තමා පෞද්ගලිකවම සෑහීමකට පත්වන්නේ නම් පමණක් ඒ බැව් සනාථ කරමින් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරි විසින් ඒ පිළිබඳ වාර්තාවක් ද සමඟ වන්දි අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

10. මෙම චක්‍රලේඛය 2014.12.01 දින සිට ක්‍රියාත්මක වේ. ඒ අනුව 1991.10.31 දිනැති අංක 44/91 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 2014.11.30 දින සිට අවලංගු කරනු ලැබේ.

පී.බී.අබේකෝන්

ලේකම්

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම I

## I වන උපලේඛනය

( 2 (1) වන වගන්තිය )

### ස්ථිර අසම්පූර්ණ අබලතාවක් සිදු කෙරේ යයි සළකනු ලබන තුවාල ලැයිස්තුව

| තුවාල | ඉපැයීමේ ශක්තිය නැතිවීමේ ප්‍රතිශතය |
|---|---|
| ස්ථිර වශයෙන්ම ඔත්පල වීමක් සිදු කෙරෙන ස්ථිර වූද, අසාධ්‍ය වූද අවයව පක්ෂඝාතය හෝ තුවාල | 100 |
| වැඩ කිරීමේ පූර්ණ ආශක්නුතාව සිදු කෙරෙන, ස්ථිර වශයෙන්ම අසාධ්‍ය මානසික ශක්තිය නැතිවීමේ හෝ ස්ථිර වශයෙන්ම වැඩකිරීමේ පූර්ණ ආශක්නුතාවය සිදු කෙරෙන වෙනත් යම් තුවාලයක් | 100 |
| **ඇසේ තුවාල :-** | |
| (I) ඇස් දෙකේ පෙනීම මුළුමණින්ම නැතිවීම | 100 |
| (II) එක ඇසක පෙනීම මුළුමණින්ම නැතිවීම | 50 |
| (III) එක් ඇසක පෙනීම යම් ප්‍රමාණයකින් නැතිවීම | 25 |
| **ශ්‍රවණ ආබාධ :-** | |
| (I) ශ්‍රවණය මුළුමණින්ම නැතිවීම | 60 |
| (II) එක් කනක ශ්‍රවණය මුළුමණින්ම නැතිවීම | 30 |
| (III) එක් කනක ශ්‍රවණය යම් ප්රමාණයකින් නැතිවීම | 15 |
| **කථනය නැතිවීම :-** | |
| (I) කථනය මුළුමණින්ම නැතිවීම | 75 |
| (II) කථනය යම් ප්‍රමාණයකින් නැතිවීම | 35 |
| **ඉන්ද්‍රියයන් නැතිවීම :-** | |
| (I) ගන්ධය සහ රස දැනෙන ඉන්ද්‍රියයන් මුළුමණින්ම නැතිවීම | 50 |
| (II) ගන්ධය දැනෙන ඉන්ද්‍රියය මුළුමණින්ම නැතිවීම | 25 |
| (III) රසය දැනෙන ඉන්ද්‍රියය මුළුමණින්ම නැතිවීම | 25 |
| **බාහුවේ තුවාල :-** | |
| (I) වැලමිටෙන් හෝ ඊට ඉහළින් බාහුව නැතිවීම | 75 |
| (II) වැලමිටෙන් හෝ ඊට පහළින් බාහුව නැතිවීම | 65 |
| **අත්වල තුවාල :-** | |
| (I) අත් දෙකම නැතිවීම | 100 |
| (II) අතක් හෝ මාපට ඇඟිල්ලක් සහ ඇඟිලි හතරක් නැතිවීම | 65 |
| (III) මාපට ඇඟිල්ලක් (ඇඟිලි පුරුක් දෙකම) නැතිවීම | 35 |
| (IV) මාපට ඇඟිල්ලක් (එක් ඇඟිලි පුරුකක්) නැතිවීම | 20 |
| (V) ඇඟිලි හතරක් නැතිවීම | 60 |

**දබරඇඟිල්ල නැතිවීම :-**

| | | |
|---|---|---|
| (I) | පුරුක් තුනක් | 30 |
| (II) | පුරුක් දෙකක් | 20 |
| (III) | පුරුක් එකක් | 10 |

**මැද, වෙද සහ සුළැඟිලි නැතිවීම :-**

| | | |
|---|---|---|
| (I) | ඇඟිලි පුරුක් තුනක් | 20 |
| (II) | ඇඟිලි පුරුක් දෙකක් | 10 |
| (III) | ඇඟිලි පුරුක් එකක් | 05 |

**කකුල නැතිවීම :-**

| | | |
|---|---|---|
| (I) | දණහිසින් හෝ ඉන් ඉහළට | 75 |
| (II) | දණහිසින් හෝ ඉන් පහළට | 65 |

**පාදවල තුවාල :-**

| | | |
|---|---|---|
| (I) | දෙපා නැතිවීම | 100 |
| (II) | එක් පාදයක් නැතිවීම | 75 |
| (III) | එක් පාදයක ක්‍රියාකාරීත්වය යම් ප්‍රමාණයකින් නැතිවීම | 35 |

**පා ඇඟිලි නැතිවීම :-**

| | | |
|---|---|---|
| (I) | පා මාපට ඇඟිල්ල - ඇඟිලි පුරුක් දෙකට | 20 |
| (II) | පා මාපට ඇඟිල්ල - එක් ඇඟිලි පුරුකක් | 10 |
| (III) | පා මාපට ඇඟිල්ල නොවන එකකට වැඩි ඇඟිලි ගණනක් නැති වුවහොත් එක් එක් ඇඟිල්ලකට | 10 |

**විවිධ :-**

| | | |
|---|---|---|
| (I) | ජනනේන්ද්‍රියන් මුළුමණින්ම නැතිවීම | 75 |
| (II) | ජනනේන්ද්‍රියන් අසම්පූර්ණ වශයෙන් නැතිවීම | 40 |
| (III) | මුහුණේ බරපතල කැළැල් ඇති වීම හෝ මුහුණ විරූප වීම | 75 |
| (IV) | මුහුණේ කැළැල් ඇති වීම හෝ මුහුණ විරූප නොවන ශරීරය බරපතල ලෙස විරූප වීම - උපරිමය | 50 |
| (V) | එක් දතක් නැතිවීම | 05 |
| (VI) | වෛද්‍ය නිලධරයෙකු විසින් තක්සේරු කරනු ලැබිය යුතු ඉහත සඳහන් නොකරන ලද යම් අවයවයක් හෝ ඉන් යම් කොටසක් (උදා:- නාසය, ලපැත්ත, කන ආදිය) නැතිවීම උපරිමය | 50 |

**සටහන :-**

ලබාගත හැකි වාර්තා පදනම් කර ගෙන තුවාලය ලැබූ අවස්ථාවේදී රෝගියා පත්ව තිබූ තාවකාලික ආබාධිත භාවය සඳහා 10% ක උපරිම ප්‍රමාණයන් නිර්දේශ කළ හැකිය.

යම් එක් අනතුරකදී මුළු තක්සේරුව 100% නොඉක්ම විය යුතුය.

**තුවාල වන්දි/දීමනාව සඳහා අයදුම්පත**

**காயங்களுக்கான இழப்பீடு/படிக்கான விண்ணப்பம்**

# Application for Compensation/Allowance for Injuries

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම:-
விண்ணப்பதாரியின் முழுப்பெயர்:-
Full name of the applicant:-

01.01 ජාතික හැඳුනුම්පත් අංකය:-
தேசீய அடையாள அட்டை இலக்கம்-
National Identity Card Number:-

2. ස්ථිර ලිපිනය:-
நிரந்தர முகவரி:-
Permanent Address:-

3. සේවය කරන දෙපාර්තමේන්තුව :-
சேவையாற்றும் திணைக்களம்:-
Department serving:-

4. තුවාලය සිදු වූ දිනට උසුලන තනතුර:-
காயம் ஏற்பட்ட திகதியன்று வகித்த  பதவி:-
Post held as at the date on which the injury occurred:-

5. අයදුම්කරු දැනට උසුලන තනතුරෙහි ස්ථිර කරන ලද්දේ ද යන වග:-
விண்ணப்பதாரி தற்பொழுது வகிக்கும் பதவியில் உறுதிப்படுத்தப்பட்டுள்ளாரா?
Whether the applicant has been confirmed in the  post held at present:-

6. රාජකාරි ලිපිනය:-
அலுவலக முகவரி:-
Official Address:-

7. රාජකාරිය සඳහා පැමිණෙන නිවසේ ලිපිනය:-
விண்ணப்பதாரி கடமைக்கு அறிக்கையிடுவதற்கு வரும்பொழுது வசித்துவரும் முகவரி:-
Address of the residence from where the applicant reports for duty:-

8. තුවාලය/අනතුර සිදු වූ දිනය, වේලාව හා ස්ථානය:-
காயம்/ விபத்து ஏற்பட்ட திகதி, நேரம், இடம்:-
Date, time and place at which the injury/accident occurred:-

9. අනතුරෙහි ස්වභාවය:-
காயம்/ விபத்தின் தன்மை:-
Nature of the injury/accident:-

10. අනතුර සිදුවූයේ රාජකාරි කාලය අතරතුරද? රාජකාරියට පැමිණීමේදී ද? රාජකාරිය නිම වී ආපසු යාමේදී ද යන වග:-
விபத்து இடம்பெற்றது விண்ணப்பதாரி கடமையில் இருக்கும் பொழுதா? கடமைக்கு அறிக்கையிடுவதற்கு வரும் பொழுதா? அல்லது கடமையின் பின்பு திரும்பிச் செல்லும் பொழுதா?
Whether the applicant met with the whilst in duty? on the way to reporting for duty? or leaving after duty:-

11. උපන් දිනය:-
பிறந்த திகதி:-
Date of Birth:-

12. තුවාලය/අනතුර සිදු වූ දිනට අයදුම්කරුගේ වයස:-
காயம் நிகழ்ந்த திகதியன்று விண்ணப்பதாரியின் வயது:-
Age of the applicant as at the date on which the injury occurred:-

13. අන්තිමට සේවය කළ දිනය:-
(අන්තිමට සේවය කළ දිනය හා තුවාල සිදු වූ දිනය අතර වෙනසක් තිබේ නම් පැහැදිලි කළ යුතුය)
கடமைக்கு அறிக்கையிட்ட இறுதித் திகதி:-
(கடமைக்கு அறிக்கையிட்ட திகதி மற்றும் காயம் ஏற்பட்ட திகதிக்கு இடையில் வேறுபாடு இருப்பின் தயவுசெய்து காரணத்தினை விபரிக்கவும்).
Last date of reporting for duty:-
(If there is a difference between the last date of reporting for duty and the date on which the injury occurred, please explain reasons)

ඉහත සඳහන් කරුණු සත්‍ය බව සහතික කරමි.
மேற்படி விபரங்கள் உண்மையாக உள்ளன என்று நான் அத்தாட்சிப்படுத்துகின்றேன்.
I certify that the above particulars are true.

..........................................................
අයදුම්කරුගේ අත්සන
விண்ணப்பதாரியின் கையொப்பம்
Signature of the Applicant

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව

**திணைக்களத் தலைவரின் அறிக்கை**

**<u>Report of the Head of the Department</u>**

14. අනතුර සිදු වූ දිනය:-
காயம் ஏற்பட்ட திகதி:-
Date on which the injury occurred:-

15. වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ දිනය:-
மருத்துவர் சபைக்கு விடயம் குறித்துரைக்கப்பட்ட திகதி:-
Date on which the matter was referred to the medical board:-

16. මේ අතර වෙනසක් තිබේ නම් එයට හේතු:-
திகதிகளுக்கு இடையில் வேறுபாடு இருப்பின் காரணங்களைக் குறிப்பிடவும் :-
If there is a difference between the above dates, indicate the reasons:-

17. අනතුර සිදු වූ දින වන විට ලැබූ මාසික /දෛනික වැටුප්:-
காயம் ஏற்பட்ட திகதியில் பெறப்பட்டது மாதாந்த / நாள் கூலி:-
Obtained as at the date on which the injury occurred Monthly or daily wages:-

ඒකාබද්ධ වැටුප:-
திரட்டியது :-
Consolidated:-

විශේෂ දීමනා:-
விசேட படி:-
Special Allowance:-

(I) වන්දි ගෙවීමට අදාළ වාර්ෂික වැටුප:-
இழப்பீட்டிற்காகப் பொருத்தமான வருடாந்த வேதனம்:-
Annual Salary applicable for the compensation:-

(II) අනතුර සිදු වූ දින දක්වා ලැබිය යුතු වැටුප සහ වැටුප් වර්ධක ගෙවා තිබේද?
விபத்து ஏற்பட்ட திகதிவரை வேதனம் மற்றும் வேதன ஏற்றங்கள் வழங்கப்பட்டுள்ளதா?
Whether salaries and salary increments have been paid up to the date on which the accident occurred?

18. (I) පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය හා අනතුර සිදු වූ අයගේ සාක්ෂි ඇතුළත් මූලික පරීක්ෂණ වාර්තාව:-

විபத்தினைச் சந்தித்தநபரின் சாட்சியத்தினை உள்ளடக்கி புலனாய்வு உத்தியோகத்தரின் ஆரம்பப் புலனாய்வு அறிக்கை மற்றும் முடிவு:-

Preliminary investigation report consists of the evidence of the person faced with the accident and the conclusion of the investigation officer:-

(II) වෛද්‍ය මණ්ඩලයේ වාර්තාව:-

மருத்துவர் சபையின் அறிக்கை:-

Report of the Medical Board:-

19. ලැබූ වෛද්‍ය නිවාඩු:-

பெறப்பட்ட மருத்துவ லீவுகள்:-

Medical Leave obtained:-

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය:-

திணைக்களத் தலைவரின் பரிந்துரை:-

Recommendation of the Head of the Department:-

අයඳුම්කරු තමාගේ රාජකාරි කටයුතුවල නිරතවීමේදී/රාජකාරිය සඳහා පැමිණීමේදී/රාජකාරිය නිම කර ආපසු යන ගමනේදී මෙම අනතුරට මුහුණ පා ඇති බවට සෑහිමට පත්වන බවත් ඉහත සඳහන් කරුණු නිවැරදි බවත් සහතික කරමි.

உத்தியோகத்தர் கடமையில் இருக்கும் பொழுது/ கடமைக்கு அறிக்கையிடுவதற்கு வரும் பொழுது/ கடமையின் பின்பு திரும்பிச் செல்லும் பொழுது இந்த விபத்து இடம்பெற்றது என்றும் மேலும் மேற்படி விபரங்கள் உண்மையாக உள்ளன என்றும் நான் அத்தாட்சிப்படுத்துகின்றேன்.

I hereby certify that the officer has met with the accident whilst in his duties/ on the way to reporting for duty, or leaving after duty and further certify the above particulars are correct.

......................................

දෙපාර්තමේන්තු ප්‍රධානියා

திணைக்களத் தலைவர்

Head of the Department

දිනය:-

திகதி:-

Date:-

වන්දි ගෙවීමේ කමිටුවේ නිර්දේශය

இழப்பீட்டுக்குழுவின் பரிந்துரை

Recommendation of the Compensation Committee